තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## දිනීෂා එදිරිවීර එ. නාගරික සංවර්ධන අධිකාරිය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 588/2018 (2019.07.01) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - දිනීෂා එදිරිවීර
**නොතිසි ලත් පාර්ශවය**- සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**

අභියාචක - දිනීෂා එදිරිවීර
පොදු අධිකාරිය - විනිතා රණසිංහ- ලිපිකරු
දසුන්තාද සිල්වා- සහකාර අධ්‍යක්ෂ

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.04.25 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.06.14 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.07.09 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:

අභියාචක විසින් 2018.04.25 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

2018.03.14 දරන මාගේ ලිපියට අදාල BA /N /122 / 2016 සැලසුම පිළිබඳ පහත තොරතුරු

1. මෙම ව්‍යාපෘතියට නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා දී තිබේද? ඒ කවදාද?
2.අඩි 18ක් පමණක් පළලැති අලකේශ්වර පාරේ තට්ටු 9ක ව්‍යාපෘතියක් අනුමත කල හැකිද?
3. ප්‍රවේශ මාර්ගයට ඉදින් කොටසක් පවරා දී ඇත්නම්, එම කොටස අහුරා වටකොට තැබිය හැකිද?
4. ප්‍රවේශ මාර්ගයට පවරා දිය යුත්තේ එම ඉඩම මායිමේ පමණක්ද? නැත්නම් සම්පූර්ණ මාර්ගයමද ?
5. එම ගොඩනැගිල්ලට යටවී ඇති බිම් කොටස 65% ඉක්මවා ඇතිබව ගොඩනැගිලි සැලසුමෙහි ඇති මිනුම් අනුව නොදන්නේද? (එය 76% කි)
6.ජිම් සහ ක්ලබ් හවුස් ඇති මහල මහලක් සේ පිළිගන්නේද?
7. රථගාල සඳහා වෙන් කල මහල මහලක් ලෙස සලකන්නේද?
8. අතරමැදි මහල මහලක් සේ සලකන්නේද?
9.ඉහත සඳහන් මහල් 3න් නිවාස සහිත මහල් 6ක් සහිතව තට්ටු 9ක ගොඩනැගිල්ලක් සඳහා තිබිය යුතු අවම ප්‍රවේශ මාර්ගයේ පළල කොතෙක්ද?
10. මෙම ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි වලට අනුකූලද? තවද මෙම ගොඩනැගිල්ලට නිසියාකාර වෙන්ටිලේෂන් සහ සනීපාරක්ෂක පහසුකම් තිබේද?

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.06.14 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.07.09 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

2019.07.01 පාර්ශව දෙකම පැමිණ සිටිති. තට්ටු 9ක ගොඩනැගිල්ලකට අවසර දීම ගැන තොරතුරු ඉල්ලා ඇත. ඒ ගැන ගත් ක්‍රියාමාර්ගය සම්බන්ධ තොරතුරුය. එම තොරතුරු වෙනත් ආයතනයකට අදාළ වේ. (කෝට්ටේ නගර සභාවට) ඉදිරිපත් වූ කරුණු අනුව අලුත් ඉල්ලීමක් කිරීමට උපදෙස් දෙන ලදී. ගොනුවේ කටයුතු අවසන් කෙරිණ. 2019.07.08 තීන්දු විය.

## නියෝගය:

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව නොපවතින හෙයින් අභියාචනය අවසන් කරනු ලැබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****